*Vidyodaya J. Arts, Sci. Lett. Vol.* 2 *No.* 2, *pp.* 111–124 *July*, 1969.

# සිදත් සඟරාව පද්‍යකරණය සඳහා ලියූ අත් පොතක් ද?

විද්‍යොදය විශ්වවිද්‍යාලයේ සිංහලාංශයේ

**විමල විජයසූරිය**

විසිනි.

දඹදෙණි සමයෙහි ලියවුණු පතිරජ පිරුවන් හිමියන් ගේ සිදත් සඟරාව දහතුන් වන සිය වසට අයත් කෘතියක් වුව ද අද පවා, සිංහල භාෂා අධ්‍යයනයෙහි ලා ප්‍රමෙය ග්‍රන්ථයක් ලෙස භාවිත කරනු පෙනේ. වර්තමාන විශ්වවිද්‍යාලය අධ්‍යාපනයෙහි ලා ද සිදත් සඟරාව පරිහරණය කෙරෙන නමුදු එය හුදෙක් සිංහල පද්‍යකරණයෙහි යෙදෙන ආධුනිකයන් සඳහා ම සංග්‍රහ කරන ලද්දක් සෙයින් හඳුන්වා දී ඇත.

සිදත් සඟරාව ඉතිහාසයේ කිසිදු කලක භාෂාවේ පැවති ව්‍යාකරණය පිළිබඳ ග්‍රන්ථයක් නොවන බවත් එය පද්‍ය රචකයන් (පදී බඳනාවුන්) සඳහා හෙවත් විශෙෂ-යෙන් සාහිත්‍ය රචනා කලාවේ ආධුනිකයන් උදෙසා සංග්‍රහ කරන ලද සිද්ධාන්ත මාලාවක් බවත් ම. ව. සුගතපාල ද සිල්වා මහතා පවසයි.[1]

" ඉති වියරණ දන කිවියර පදී බඳනා
ඉටු නිටු ගණ අකුරු ඈ ලකුණු විමසා බඳනෙ " (XI, I)

"දුහුනන් දනුම් සඳහා-කරනෙමි සිදත් සඟරා" ආදියෙහි කතුවරයා ම ඒ බව පවසා ඇති සැටි ද පෙන්වයි.

උගතුන් සිදත් සඟරාව සිංහල භාෂාවට ලියූ ව්‍යාකරණ ග්‍රන්ථයක් ලෙස නොමඟ යවනු ලැබුවේ එහි වූ "වියරණ" යන ප්‍රයොගය නිසා බවත් එහි වූ "දුහුනන්" යනු ද 'සිංහල භාෂාව හදරන ආධුනිකයන්' ලෙස වරදවා ගෙන ඇති බවත් ඒ මහතා පෙන්වා දෙයි. බොහෝ විචාරකයන් සිදත් සඟරාව අසම්පූර්ණ ව්‍යාකරණ ග්‍රන්ථයකැ යි ද එය අශාස්ත්‍රීය යැ යි ද එය භාෂාව ලියන සැටි පවා නවකයන්ට නො උගන්වති යි ද ආදි වශයෙන් දැඩි විචාරයට ලක් කොට ඇත්තේ 'දුහුනන්' හෙවත් පද්‍ය කරණයෙහි ආධු-නිකයන් යන්න භාෂාව ඉගැනීමේ නවකයන් ලෙස වරදවා ගැනීමෙන් බව ද තව දුරටත් පෙන්වා දෙයි. එකල භාවිත වූ ගද්‍ය භාෂාවට වඩා පද්‍ය භාෂාවේ ඇති මූලික කාරණා ඉදිරිපත් කිරීමේ අරමුණින් සිදත් සඟරාව ලියා ඇතැයි අවසාන වශයෙන් තීරණය කරනු පෙනේ.

---

1 "The Sidat Sañgarawa has to be looked at not as a grammar of the Sinhalese language current at any time in the history, but as a compendium of rules for the versifier, especially for the novice in this art of literary composition."

(*Paranavitana Felicitation Vol.* (PFV.) 1965, p. 68. 2

සිදත් සඟරා හෝඩියට අල්ප ප්‍රාණාක්ෂර පමණක් ගැනීම (72 පිට), උනුමිතින් උසුරවනු (75 පිට), එසේ ම සඳ, ලොප්, අදෙස්, අගම්, පෙර රූ, දෙරූ, පෙරළි, වැඩි, අඩු, නියම්, අනියම් සහ අවිදුමන් විදි යනු ද පද්‍ය කරණයෙහි අවශ්‍යතාව අනුව ඉදිරිපත් කළ බව "3 Rules of word transformation for purposes of prosody"[2] යන ශීර්ෂය යටතේ විමසා ඇත.

මේ මතය මෙකල ව්‍යාකරණඥයන් විසින් අවිවාදයෙන් පිළිගෙන ඇති බව පහත දැක්වෙන පාඨවලින් ද සනාථ වේ.

"බොහෝ දෙනෙක් 'දුහුනන් දනුම් සඳහා' යන්න වැරදියට අවබොධ කර ගෙන ඇත. මෙහි දුහුනන් යී සඳහන් කර ඇත්තේ පද්‍ය බන්ධයට ආධුනිකයන් ය. නො එසේ ව ව්‍යාකරණයට ආධුනිකයන් නො වේ. මෙහි එන නිදසුන් වැඩි කොටසක් පද්‍ය බණ්ඩයන් ය. ගද්‍ය යොද ඇත්තේ කිහිප පොළක පමණි.

'වහරනු සෙරෙන් සපයා' යි සඳහන් කර ඇත්තේ පද්‍ය ග්‍රන්ථයන් පිළිබඳ අදහස් කොට විය යුතු ය. මෙහි ඇති සාමාන්‍ය උදාහරණ පවා පද්‍යාකාරයෙන් යොද ඇත්තේ ඒ නිසා ය.... සිදතේ එන වියරණ විධි විස්ස වියරණයට අවශ්‍ය ඒවා ම නො වේ. එහෙත් කවිය සඳහා අවශ්‍ය ඒවා බව නම් පැහැදිලිය".[3]

ජේ. බී. දිසානායක මහතුන් ගේ මේ අදහස් ද ඇත්ත වශයෙන් ම ම. ව. සුගතපාල ද සිල්වා මහතා විසින් ලියන ලද අදහස්වල ම ප්‍රතිරාවයක් සේ ය. එහෙත් මෙයින් ද ඔප්පු වන්නේ පූර්වෝක්ත මතය ඉතා ප්‍රබල එකක් බව යි.

මෙය ගොඩ නැංවීම සඳහා මේ වියතුන් දෙදෙනා ම ප්‍රථමයෙන් ඉදිරිපත් කරන ප්‍රධාන සාධකය මේ ය.

"ඉති වියරණ දැන කිවියර පදී බඳනා
ඉටු නිටු ගණ අකුරු ඇ ලකුණු විමසා බඳනෙ" (XI, I)

යන සිදත් සඟරා පාඨය යි. වියරණ උගෙන අවසන් කෙනෙක් කවියකු වශයෙන් පද්‍ය බන්ධනය කරත් නම් එහි දී ඔහු විසින් එකල පද්‍ය බන්ධනයට අවශ්‍ය ය යි සැලකූ ඉටු නිටු ගණ ක්‍රමය හා ඉටු නිටු අකුරු ද වෙනත් අලංකාර හා දෙෂ ආදිය ද විමසා උගෙන පද්‍ය බන්ධනය කළ යුතු බව යි, මින් අදහස් කරන ලද්දේ. මේ අනුව සිදත් සඟරාවේ මුල් පරිච්ඡේද දසයෙන් ඉගැන්වූ සම්ප්‍රදායානුකූල ව්‍යාකරණ විභාගයන් අග අදියර දෙකෙහි ඇතුළත් පද්‍යාකරණය හා සම්බන්ධ වෙනස් ඉගැන්වීම සවල්පයට පසුබිම් කිරීම සුදුසු ද ?

ව්‍යාකරණ ග්‍රන්ථයක අගට පද්‍ය බන්ධනයට අයත් ඉගැන්වීම් සවල්පයක් එකතු කොට දක්වා තිබීම සිදත් සඟරාව බෙහෙවින් ම ගුරු කොට ගත් සම්ප්‍රදායානුකූල සංස්කෘත හා පාලි ව්‍යාකරණ ග්‍රන්ථවල ආකෘතියට ඉඳුරා ම වෙනස් ය. එය සිංහල ව්‍යාකරණ ක්ෂේත්‍රයේ කාලානුරූප ව ඇති වූ අන්‍ය බලපෑමක ප්‍රතිඵලයකි. ආචාර්ය එම්. එච්. පීටර් සිල්වා මහතා එය මෙසේ හඳුන්වා දෙයි :

---

2 PFV. p. 77.

3 "සිදත් සඟරාව ව්‍යාකරණ ග්‍රන්ථයක් නොවේ" සාරංගා විශ්වවිද්‍යාලයීය සඟරාව. (මංගල පියවර, 1969) 16 පිට.

"වීර සෝළියම් වියරණය ද කාතන්ත්‍රය ගුරු තන්හි තබා ලියන ලද්දකි. එහි කතුවරයා දකුණු දඹදිව දෙමළ දෙස 'පොන්පට්ටි'යෙහි වූ බුද්ධමිත්‍ර නම් කෙනෙකි. බෞද්ධ භික්ෂුවකැ යි අනුමාන කළ හැක්කේ ය. වීර සෝළියමෙහි අග එන අලංකාධිකාරය දණ්ඩින් ගේ කාව්‍යාදර්ශය අනුව සකස් වී ඇත. ........එළුත්තු (අක්ෂර), සොල් (පද), පොරුළ් (අර්ථ), යාප්පු (ඡන්දස්), අණි (අලංකාර) යන පස් කොටසට බෙද වියරණ ලිවීම දෙමළයෙහි සිරිත යි. සකු මගද දෙ බසෙහි ම වියරණයන්හි නො ආ ඉටු නිටු අදියරක් හා ලකර අදියරක් සිදත් සහරාවට ආයේ මේ දෙමළ සිරිත නිසා බව කිව යුතු ය."[4]

සිදත් සහරාවේ 'සේනන් බුහුමනන්නේ ඈ හුණා බැවින් නන් විබතින් සිදු පා' (IV–2) යන කම් විබත් පියොව විස්තර කරන සිදත් සහරා පුරාණ සන්නය "සූත්‍රොච්චාරණයෙහි ශ්‍රූයමාන වූ විභක්තිය ගේ ග්‍රහණය වීර සෝළියන් ආදී ද්‍රවිඩ ව්‍යාකරණකාරයන් විසින් ආචරිත නු"යි යනු සඳහන් කරයි. මෙ සේ ම පෙළ සකු වියරණ මහට නුහුරු තවත් සිදත් රැසක් එනම් කව් ලැකිය හා ලෙව් ලැකිය, ගතකුරු පණකුරු නම්, පද-විබත්-කිරිය පෙරළි, නියම් අනියම් විදි, නිපන් තසම තබව පියෙවි, අරුත් වියකන වර ලබ ද යොදනු, ගණ ල පස ද වූ සෙ ආදි වශයෙන් ඉදිරිපත් කරන පිටර් සිල්වා මහතා මේ අභිනව අංග ද්‍රවිඩ සංස්කෘතික බල පෑම් ඔස්සේ අපේ ව්‍යාකරණ ක්ෂේත්‍රයට මෙකල පිවිස ඇති බව පෙන්වා ලදයි.

මෙ සේ කාලීන බලපෑමක ප්‍රතිඵල වශයෙන් ග්‍රන්ථාවසානයට අභිනවයෙන් එකතු වූ අමුතු කොටසක් නිසා මුළු ව්‍යාකරණ සම්ප්‍රදයේ ම මූලික අරමුණු සියල්ල වෙනස් වූ බවක් තීරණය කළ නො හැක. සිදත් සහරාවේ අග අදියර දෙකින් පද්‍ය කරණයට සම්බන්ධ කරුණු කීපයක් විභාග කළ නිසා මුල් අදියර දසයෙන් දක්වූ ව්‍යාකරණ සිද්ධාන්තත් පද්‍ය කරණයට ම සීමා වේ යැ යි සිතීමට ඉඩ නැත. භාෂාවේ ව්‍යාකරණය ගැන වියරණ පොතකට අඩංගු වන්නේ එකල උගතුන් පිළිගත් කරුණු ය. ඒ සිද්ධාන්ත ය. ඉටු නිටු ලකර අදියර දෙක ද්‍රවිඩ ව්‍යාකරණ සම්ප්‍රදය පිළිබඳ සිද්ධාන්තයක් ලෙස සිදත් සහරාවට පිවිස ඇති බව මුත් ඒ නිසා ම මුළු සිදත් සහරාව ම පද්‍යාකරණය උදෙසා ලියූවකැ යි එපමණකින් පිළිගැනීම අයුතු ය.

"වැඩි නම් මත් වැඩි, අඩු නම් මත් අඩු, සද දහමින් සඳහෙනි හොත පස් පෙරළි ඈ කරනු"[5] යන ව්‍යාකරණ නියමයන් සඳහා මාත්‍රා, ඡන්දස් පිළිබඳව සඳහන් කොට තිබීම සිදත් සහරාව පද්‍ය කරණය සඳහා ලියූවක් සේ සැලකීමට හේතුවක් නො වේ. පුරාතන ව්‍යාකරණ සම්ප්‍රදයේ ම ශාඛාවන් වූ පාලි බාලාවතාර හා සංස්කෘත සාරස්වත වැනි ආධුනිකයන් ගේ ජනප්‍රිය ව්‍යාකරණ ග්‍රන්ථවල වුව ද මාත්‍රා ඡන්දස් මත ව්‍යාකරණ විභාගයන් ඉදිරිපත් කොට ඇත. සාරස්වතෙහි හ්‍රස්ව දීර්ඝ ප්ලුත යන ස්වර හඳුන්වා දෙන්නේ ඡන්දශ්ශාස්ත්‍රයෙහි ඇතුළත් මාත්‍රා අනුව ය.

"එක මාත්‍රො භවෙද්ධ්‍රස්වො ද්විමාත්‍රො දීර්ඝ උච්‍යතෙ"[6] ආදි වශයෙනි. ධර්මකීර්තිපාදයන් ගේ බාලාවතාරයෙහි ද සමහර ව්‍යාකරණ ප්‍රයොග සිද්ධ කොට ඇත්තේ ඡන්දස් මාත්‍රා මුල් කර ගෙන ය.

---

4 "සිංහල දෙමළ ව්‍යාකරණ සංසන්දනය" කොළඹ ප්‍රාචීන භාෂොපකාර සමාගමේ 1963 ශාස්ත්‍රීය සංග්‍රහය, 36–37 පිටු.

5 හි. සුමංගල–සිදත් සහරා සන්නෙ (1914) 26, 27, 28 පිටු.

6 නාරායණාරාම ආචාර්‍ය–සාරස්වත (1952) 2–3.

සිදත් සඟරාව පද්‍යකරණය සඳහා ලියූ අත් පොතක් ද ?

"**ඡාකාය සුඛුච්චාරණං ඡන්දහානිපාං ච වණ්ණ ලොපොපි**", "**වුත්තායභෙදය විකාරොපි**", "අක්ඛර නියමො ඡන්දං ගරු ලහු නියමො භවෙ වුත්ති
දීඝො සංයොගාදී පුබ්බො රස්සො ගරු ලහුතු රස්සො".[7]

නූතන ඓතිහාසික ව්‍යාකරණඥයන් පවා භාෂා පරිණාමය දැක්වීමේ දී නාම පදවල මාත්‍රා ප්‍රමාණ ගුරු කොට ගෙන ඇත.[8] ව්‍යාකරණ නීති සංග්‍රහ කිරීමේ දී ගද්‍යයෙහි පමණක් නොව පද්‍යයෙහි ද පවත්නා ව්‍යාකරණ විශේෂතා ගෙන හැර දැක්වීම පතිරජ හිමියන්ට මතු නො ව එම සම්ප්‍රදයට ම අයත් පෙළ සකු වියරණ ඇදුරන් ගේ ද සිරිතක් වූ බව මින් සනාථ වේ. ග්‍රන්ථයක් සමස්ත වශයෙන් නො ගෙන එහි එක දෙශයක් මත මුළු ග්‍රන්ථයට ම බලපාන තීරණයක් ගැනීම ශාස්ත්‍රීය නො වනවා පමණක් නො ව, ඒ අනුව, සාරස්වත බාලාවතාර ආදි අනෙකුත් ව්‍යාකරණ ග්‍රන්ථ පවා පද්‍යකරණය සඳහා රචිත ය යි සාවද්‍ය නිගමනයකට බැසීමට පවා සිදු වනු ඇත.

සිදත් සඟරාව පද්‍යකරණය සඳහා ලියූවකැ යි ඔප්පු කිරීමට සුගතපාල ද සිල්වා මහතාට ඉවහල් කර ගත හැකි වූයේ එම ග්‍රන්ථයෙහි ඉතා සුළු කොටසක් පමණි. ඉහත දැක්වූ පරිදි ගතකුරු, උනුමත්, හා විසි වැදැරුම් වියරණ විදිවලින් ද දෙළසක් පමණි. ඉතිරි සිද්ධාන්ත පද්‍ය කරණය සඳහා නොවන බව එතුමා පිළිගනී. එසේ නම් එහි කාර්‍ය්‍යය හා ඵලය කුමක් ද ?

ජේ. බී. දිසානායක මහතා මේ මතයෙන් තවත් ඈතට ගොස් "**සිදතේ එන වියරණ විදි විස්ස වියරණයට අවශ්‍ය ඒවා ම නොවේ. එහෙත් කවිය සඳහා අවශ්‍ය ඒවා බව නම් පැහැදිලිය**" යි[9] පවසයි. පද්‍යකරණය සඳහා ඉවහල් වෙතැ යි සුගතපාල ද සිල්වා මහතා කී වියරණ විදි දෙළස වෙනුවට වියරණ විදි විස්ස ම කවිය සඳහා යයි කියන්නේ සුගතපාල මතය අතිශයොක්තියට නැඟීමෙන් මිස කිසිදු හේතු සාධකයක් මත නො වේ. සන්, ලිඟු, විබත්, සමස්, පියෙවි, පස, කිරිය, නිපා, වැනි ව්‍යාකරණාංගවලින් පද්‍ය-කරණයට කවර උපදෙසක් ලැබේ ද ?

මේ කරුණු සලකා බැලීමෙන් ද සිදත් සඟරාවේ ආචීර්ණ කල්පික ව්‍යාකරණ සිද්ධාන්ත විමසා බැලීමෙන් ද අප නිගමනය කරන්නේ සිදත් සඟරාව පද්‍යකරණය සඳහාම ලියූවක් නො ව කිසියම් කාල පරිච්ඡෙදයකට අයත් ගද්‍ය පද්‍ය දෙකට ම ඇතුළත් භාෂාව පිළිබඳව සම්මතයේ පැවති පෞරාණික ව්‍යාකරණ සිද්ධාන්තවල සංග්‍රහයක් බව යි. මේ අනුව "**සිදත් සඟරාව ඉතිහාසයේ කිසිදු කලක භාෂාවේ පැවති ව්‍යාකරණය පිළිබඳ ග්‍රන්ථයක් නො වේ ය**" යන සුගතපාල ද සිල්වා මහතුන් ගේ පූර්වෝක්ත අදහස විශෙෂයෙන් ප්‍රතික්ෂේප කිරීමට සිදු වෙයි. ඒ පහත දැක්වෙන කරුණු අනුව ය.

(i) පණකුරු පසක් යයි මුලින් ම ප්‍රකාශ කොට යළිත් 'ලුහු ගුරු බෙයින් දස වේ' යයි බෙද දැක්වීම, හෝඩියට පසුවත් කෙවල (හුදුව) හා ගාත්‍රස්ථ (ගත් අරුණු) දීඝ සවර යනුවෙන් නිදසුන් දෙවගයක් මඟින් එය සනාථ කිරීම,

(ii) පණකුරු වශයෙන් සිදතේ දැක්වුණු සවර මාලාවට ඇ, ඈ දෙක ඇතුළත් නොවීම හා මත් වැඩුමක් වශයෙන් (?) ඇ ගැන කරන විධානය,

---

7 සිරිධම්මාරාම–බාලාවතාරො 8–9, පිටු 1, 5, 10.

8 W. Geiger–*A Grammar of the Sinhalese Language*, (GSL) 1938 p. 27. 22.
D. J. Wijayaratna–*History of the Sinhalese Noun*, (HSN) 1956, Chap. I ( Stem ) pp. 30–31.

9 සාරංගා, 16 පිට.

(iii) සමකාලීන හා පූර්වකාලීන භාෂාවේ බහුල වශයෙන් භාවිත වූ මහා ප්‍රාණාක්ෂර ද සිදත් හෝඩියට ඇතුළු නොවීම,

(iv) කව් ලැකියෙහි හා ලෙව් ලැකියෙහි බින්දුව සපුරා උසුරුවන බවට නිදසුන් දක්වා බින්දුවේ අවශ්‍යතාව දැක්වීම,

(v) ඒ සමඟ ම බින්දුව උනුමතින් (ඌන මාත්‍රයෙන්) කියවෙන බවට නිදසුන් දැක්වීම හා හෝඩියට ඇතුළත් නොවූ එකී ඌන මාත්‍ර සඤ්ඤකය මත් අඩුවේ දී දැක්වීම,

(vi) ලිංග භේදයේ දී සාමාන්‍ය අචේතන නාම පුං ස්ත්‍රී ලිංග ද්වයට ඇතුළු කොට සිංහලයේ ලිංග දෙකක් පෙන්වීම.

සිදත් සඟරාවේ එන මෙබඳු සිද්ධාන්ත රාශියකින් කිහිපයක් විමසීමෙන් ඒවා සිංහලයෙහි ඓතිහාසික භාෂා යුග කිහිපයක පුරාණ ව්‍යාකරණ සම්ප්‍රදායන් මිස සිදත් සඟරා කතුවරයාගේ ව්‍යභිචාර දර්ශනයන් හෝ පද්‍ය කරණය වැනි පරමාර්ථයක් දක්වන්නක් හෝ නොවන බව පෙන්වා දිය හැකි ය. මේ කරුණු විභාගයේ දී එහි සිද්ධාන්තවලට පසු බිම් වූ සමහර ප්‍රමාණයන් ගැන සොයා බැලීම ද ප්‍රයෝජනවත් ය. සිදත්, සදරුත් විදි, සේ පියෝනන්, වහරනු සෙරෙන්, සිදු සේ, ඇදුරු උගහා, සේපා, ලැකියනුසෙරෙන්, සදතු දතු වහර නො ලහනු ආදිය සිදත් සඟරාවේ වියරණ නීති රීතිවල දී ප්‍රමාණ කර ගෙන ඇත. මෙයින් ප්‍රකාශ වන්නේ පුරාතන සම්ප්‍රදාය පිළිබඳ ප්‍රතිපත්තිය යි.

පාලි, සංස්කෘතාදි අතිපුරාතන භාෂාවලට ව්‍යාකරණ ග්‍රන්ථ (බාලාවබෝධන, මොග්ගල්ලායන ආදිය) සැපයීමට තරම් එම විෂය මහත් කොට අගය කළ ලාංකික පඬිවරයන් ව්‍යාකරණ විෂයෙහි පැරණි සම්ප්‍රදායන් ව්‍යාප්ත කිරීමට බෙහෙවින් උනන්දු වූ බව ප්‍රකට ය. සිංහල ව්‍යාකරණය හැදෑරීමේ දී හා ඒ විෂයට අයත් පොත පත ලිවීමේදී ද පුරාතන සම්ප්‍රදායන් (–ඇදුරු උගහා–ගුරු මත) දිගට පවත්වා ගෙන ඒම ශාස්ත්‍ර ගරුක අතීත අධ්‍යාපනයෙහි මූලික ලක්ෂණය යි. භාෂා සාහිත්‍ය ආගම ධර්ම හා දර්ශන, ශිල්ප කලා හා ශාස්ත්‍ර ආදියෙහි දක්නා ලැබෙන මේ මූල ධර්මය පුරාණ සපිති ප්‍රවණතාව යනුවෙන් හැඳින්විය හැකි ය.

සිදත් සඟරාව විග්‍රහ කළ භාෂාව දඹදෙණි යුගයට වඩා පැරණි එකකි. එහි උපුටා දක්වන ලද ව්‍යාකරණ ලක්ෂ්‍ය පාඨයන් ඇතුළත් සාහිත්‍ය (ගද්‍ය පද්‍ය) ග්‍රන්ථ වැඩි කොටස විනෂ්ට වන තරම් පැරණි බව පෙනේ. පුරාණ සන්නය හඳුන්වා දෙන අසක්ද කව වැනි ව්‍යාකරණ ප්‍රමේය ග්‍රන්ථ අසක්ද මල ආදි දෙළොස් මහ කිවින් විසූ ක්‍රි. 7 වන ශත වර්ෂයට හෝ අයත් විය හැකි ය. ඒ අනුව සිදතේ සමහර සිද්ධාන්ත වුවත් ක්‍රි. 7 වන ශත වර්ෂයට හෝ ඉනුත් ඔබ්බට අයත් නොවේ නම් අතිපුරාතන ඒවා වීමට නොබැරි ය. (වර්තමාන) සිංහලය මේ තරම් සංවර්ධනයට පත්වූ මෙකල වුව ද ප්‍රාචීන විද්‍යාස්ථානවල පමණක් නොව විශ්වවිද්‍යාලයවල පවා සිංහල ඉගැන්වීමට අවුරුදු හත් සියයකට වඩා පැරණි සිදත් සඟරාව භාවිත කිරීමෙන් පුරාතන සම්ප්‍රදායේ ප්‍රබලත්වය පෙනේ.

(i) සිදත් සඟරාව හෝඩිය ඉදිරිපත් කිරීමේ දී පළමුව දක්වන්නේ පණකුරු පසකි. ඉන් පසුව ලුහු ගුරු භේද වශයෙන් දසයකැ යි කියයි. මේ ක්‍රමය අශාස්ත්‍රීය බවත් සංස්කෘත ව්‍යාකරණවල මෙන් හ්‍රස්ව දීර්ඝ ප්ලුත වශයෙන් ස්වර භේදත්‍රය දැක්වීම

අතිශයින් ශාස්ත්‍රානුකූල බවත් මුනිදස කුමාරතුංග මහතා[10] කියයි. පාලි සංස්කෘත භාෂාවල ස්වර විභාගය ඒ භාෂාවලට හා එකී ආචාර්ය සම්ප්‍රදයවලට අනුරූප මෙන් ම සිදත් ක්‍රමය සිංහල භාෂාවේ ඓතිහාසික සංවර්ධනය පෙන්වා දෙන පුරාතන ශාස්ත්‍රීය සිද්ධාන්තයකි. සිංහල සංස්කෘතියෙහි විශිෂ්ට කාල පරිච්ඡේදයක් වූ අනුර පුර සමයේ සෙල් ලිපිවලින් මෙහි සත්‍යය හෙළි වේ. ක්‍රි.පූ. 3 ශ.—ක්‍රි, 4/5 ශ. තෙක් බ්‍රාහ්මී (ප්‍රාකෘත) යුගයෙහි හෝ ක්‍රි. 4/5 ශ.— ක්‍රි. 7 ශ. තෙක් පූරාණ සිංහල යුගයෙහි හෝ ලිඛිත සෙල් ලිපි භාෂාවෙහි කලාතුරෙකින් (ගල්ලෙන විහාර[11], මහරත්මලේ[12], බමරගල[13] වැනි ලිපි කිහිපයක) මිස දීඝ ස්වර සංකේත භාවිත නොකරනු ලැබී ය. හ්‍රස්ව සංකෙතයෙන් ලියූ වචනවල අවශ්‍ය තන්හි දීඝ ස්වර උච්චාරණය කළ බව අභිශ්‍රැතිය (ගපති *ගාපති>ගැහැවි.) හා උච්චය (accent) (පත්ත>*පාත>පය) ආදියෙන් නිගමනය කරන ඓතිහාසික සත්‍යයකි.

එහෙත් ගල්ලෙන විහාර ලිපිය වැනි ආදිම ලිපි අතර දුර්ලභ වශයෙන් දීර්ඝ ස්වර සංකෙත (දේවාන පිය මහාරාජ ගාමණී . . . මහාලෙන අගතානාගත චාතුදිස[11] ඇත්තේ මහින්දගමනයෙන් පසු ධර්ම ප්‍රචාරයත් සමඟ උගතුන් අතර පැවති පාලි බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙනි. මෙකල ම කලාතුරෙකින් මහා ප්‍රාණාක්ෂර රූප යෙදුණේ ද මේ හේතුවෙන් විය හැකි ය.

දීර්ඝ ස්වර පිළිබඳ පරිසරයෙහි හ්‍රස්ව සංකෙත ලිවීම ලංකාවට පමණක් සීමා නො වී ය. එය වයඹදිග ඉන්දියාවේ ශාබාෂ්ගර්හි[14], මාන්සේරා[15] ආදි අශොක ලිපිවල (ක්‍රි.පූ. 3 ශ.) ද දක්නා ලැබෙන මධ්‍යතන ඉන්දු ආර්ය භාෂා ලක්ෂණයකි. සෙසු අශොක ලිපිවල දීඝ ස්වර සංකෙත සහිත (රාජා, දනෙ ආදි) වචන මේ ලිපිවල ඇත්තේ ද ලංකාවේ මෙන් රජ, දනෙ යනුවෙනි. පසු කාලයට අයත් සාඤ්චි, බාර්හූත් සංක්ෂිප්ත ලිපි පාඨවල ද දනම්, ජමත, යසිලය, යනු (දනම් ජාමාතා, යසිලාය වෙනුවට) දක්නා ලැබේ. අවුරුදු දහසකට වැඩි කලක් ලෙඛන සම්ප්‍රදයේ පැවති මේ ලක්ෂණය අතුරු දහන් වන්නේ ක්‍රි. 8 ශ. වර්ෂයේ පමණ සිට ය.

ක්‍රි. 7 ශ.ව. තෙක් ලංකාව සංස්කෘතික වශයෙන් වඩාත් දියුණු විය. භාෂා සාහිත්‍යය අතින් විශෙෂ ප්‍රගතියක් තිබුණ බව සීගිරි ගී ලිපිවලින් හා ඉතිහාස ලෙඛනගත දෙළොස් මහා කවීන් පිළිබඳ තොරතුරුවලින්[16] ද අනාවරණය වේ. මෙකල ව්‍යාකරණ සම්ප්‍රදය පොළොන්නරු දඹදෙණි යුග තෙක් අධ්‍යාපනයෙහි පැවති හෙයින් සිදත් සඟරාව ලිවීමේ දී පතිරජ පිරුවන් හිමියෝ ආරම්භයේ සිට ක්‍රි. 7 ශ.ව. තෙක් භාෂාවේ පැවති පණකුරු පහේ ව්‍යාකරණ සම්ප්‍රදය සිදතක් වශයෙන් ගුරු කොට දක්වූ හ. එහෙත් ඉන් පසුව ක්‍රමයෙන් ලෙඛනයට පිවිසි සමකාලීන භාෂාවේ ස්ථාවර වූ දීර්ඝ ස්වර රූප පස ද කෙවල වශයෙන් හා ගාත්‍රස්ථ වශයෙන් පවත්නා හෙයින් එය හෝඩියට ඇතුළත් කළ බව ද එතුමෝ සඳහන් කළ හ.

---

10 මුනිදස කුමාරණතුංග - සිදත් සඟරා විවරණය (සි.ස.වි.), බු.ව. 2498, 65 පිට.

11 *Epigraphia Zeylanica*, Vol. V. pt. ii, Plate 21, No. 5.

12 *E Z* Vol. I, pp. 61–62.

13 *Ceylon Journal of Science*, Sec. G., Vol. ii, p. 115.

14 Hultzsch – *Inscriptions of Asoka*, I, pp. 66.

15 Hultzsch - *Journal of the Royal Asiatic Society*, 1913, p. 634.

16 මහාවංසො, XLI – 13.

"ආ, ඊල්, ඌල්, ඒල්, ඕනා ඇඟි හුදුව ද සා, සී, සූ, සේ, සෝ ඇඟි ගත් අරුණු කර උසුරුවන හෙයින්ද ගුරු පස ද රුසි." (1—10)

සිදත් සඟරා පුරාණ සන්නය ද එය මෙසේ සනාථ කරයි:

"සමහර ආචාර්ය කෙනෙක් ආ—ඊ—ඌ—ඒ—ඕ— යන දීර්ඝ ප්‍රාණාක්ෂර පස ද . . . ගණනට නොගත් හ."[17]

සන්න කතුවරයා මේ පුරාතන භාෂා ලක්ෂණය පදනම් කරගත් ව්‍යාකරණ සම්ප්‍රදාය සිදතෙහි අභිනව මතයට වෙනස් නිසා සමහර ආචාර්ය කෙනකු ගේ[18] මතයෙකැ යි සැලකූ බව පෙනේ. ක්‍රි. 4–5 ශ. වර්ෂවලට අයත් විය හැකි හිඟුරෙගල ලිපියෙහි මේ පාය ඒ ලක්ෂණ දරයි.

"සිඩම් මහග (ම) ජනවයහ කහබතර යතන වසක වහරහි කදවරහි වසන යමන කහබයහ වම . . . . (බ) ණප [රවර]යහව මත තබ දවයහ ච කර අරබ බොයයහි ච . . . . . ."[19]

හය වන සියවසේ යැයි සැලකෙන මේ ලිපියෙහි ද එම ලකුණු ඇත:

"සහස වරල දළ මෙය සකණකන වෙසිම්ණිය අබ කසබගිරියෙ වෙහර සයක කහවණ දි වහරිල චිදවයහ මහ පල සවසතනට."[20]

හත් වන අටවන සියවස්වලට අයත් විය හැකි සමහර සීගිරි ගීවල ද දීර්ඝ ස්වර සංකෙත වියුක්ත පුරාණ ලෙඛන සම්ප්‍රදාය පෙනේ.

"නො දුටැ යෙයි නො හෙ දු සිකි රනවනුන වනෙ
වෙසෙයි ම හැදි අ මන ම සිකි රනවනු අතුරෙ"[21]

"වෙළෙල අ අමහ අරනට ල මෙ ගලෙ
සෙක (තු) න ලයු ලන මහවන හෙළිල (බුයුන)."[22]

ක්‍රි. 8 ශ.ව. සිට දීර්ඝ සංකෙත භාවිතය ඇතිවීමට පෙර හ්‍රස්ව සංකෙත ලියා අවශ්‍ය තන්හි දීර්ඝ ව උච්චාරණය කර තිබේ.[23] කුමාරතුංග මහතා "විශෙෂ සංකෙතයකින් දීර්ඝත්වය හඟවන බවක් ව්‍යාකරණයෙහි පැවසීම අවශ්‍ය නො වේ"[24] යයි සිදත් සඟරාවට නඟන චෝදනාව භාෂාවේ ඓතිහාසික ව්‍යවහාරය ගැන අනවබොධයෙන් කරන ලද්දක් බව මේ අනුව පැහැදිලි ය. සමහර සංස්කෘත ව්‍යාකරණ පොතක එන ස්වරයේ හ්‍රස්ව දීර්ඝ ප්ලුත දැක්වීම මිස සිංහලයේ ඓතිහාසික ව්‍යවහාරය සිදතට ඇතුළත් නොවිය යුතු යයි කුමාරතුංග මහතා කල්පනා කරන නමුත් සිංහලයේ වූ ඓතිහාසික පරිණාමය සිදත ඒ අයුරින් ම ප්‍රකාශ වන්නට සලසා ඇත.

---

17 ශ්‍රී සුමංගල, සිදත් සඟරා සන්නය (අධොලිපි), 4 පිට.

18 පාණිනියෙහි (*Haridas Sanskrit Series* 63) "අ ඉ උණ්, ඍ ඏක්, එඔඞ්, ඓඖච්" යන සූත්‍රයෙහි ද දීර්ඝ ස්වර නො දැක්විණ.

19 E.Z. Vol V. pp. 111–119.

20 E.Z. Vol. IV, pp, 132–133.

21 *Sigiri Graffiti*, Vol. ii, No. 120.

22 *Ibid*, No. 159.

23 HSN. p. 5 No. 3.

24 සි.ස.වි. 65 – 66 පිටු

(ii) ඇ, ඈ සිදත් සඟරාවේ සවර මාලාවට ඇතුළත් නො වී ය. මත් වැඩි නම් වියරණ විදියෙහි දී ඇයන්න අකාරයේ මත් වැඩුමකැයි පුරාණ සන්නයේ සඳහන් වේ.

ඉහත දක්වෙන දීඝී සවර මෙන් ම ඇ, ඈ දෙක ද ආරම්භයේ සිට ක්‍රි. 7 ශ. තෙක් ම භාෂාවේ නොපැවති සංකෙත වෙයි. ක්‍රි. 7 ශ. වෂීය අවසානයේ දී යෙදෙන්නට ගත් ඇ සංකෙතය පොළොන්නරු දඹදෙණි යුගවල සෙල් ලිපිවලත් සාහිත්‍ය ග්‍රන්ථවලත් සුලභ විය.

ආරම්භයේ දී "ඇ" යන්න සඳහා යොද ගෙන තිබෙන්නේ "අ" සංකෙතය යි. මෙහි ආරම්භය හා වැඩීම දක්වන අවස්ථා තුනක් ක්‍රි. 7–10 ශත වෂීවලට අයත් සෙල් ලිපිවලත් සීගිරි කැටපත් පවුරේ ලිපිවලත් දක්නට ඇත. මුලින් ම ක්‍රි. 7 වන සිය වසේ ඇ යන්න ඇත්තේ අ කාරය උඩ උඩුකුරුව ලියූ අර්ධ චන්ද්‍රාකෘතියකිනි (◡).



අඩක් මේ ඒ අවස්ථා තුන යි.[25] ඇ මුලින් ම ලියා ඇත්තේ අකාරය උඩින් යෙදූ බින්දු තරම වූ උඩුකුරු අඩ කවයකින් නිසා එය ඇ යන්නේ මුල් අවස්ථාව ය. ඊළඟ අවස්ථාව පිල්ල මදක් දකුණට තල්ලු වී යන්තම් ඇලව යෙදීමකි. අවසානයේ එය අකුරේ දකුණු පැත්තේ ඉහළින් දකුණට ඇලව යෙදී තිබේ. මේ බින්දු අඩ සමහර ලිපියක කෙළින් ඉරි කැබැල්ලක් සේ ද යෙදෙයි.[26] මුල් අවස්ථාවේ ඇ පිල්ල ලිවීමේ තහවුරු බවක් නැත. එසේම "ඇ" යෙදිය යුතු සියලු තන්හි ම ඇ ලියා නැත. "බෙලුම් නැත්තන්" (136), "නෙගි–නැගි", "වෙසි–වැසි", "බෙලි–බැලි" වැනි සීගිරි ගී ලිපිවල සුලභ වෛකල්පික පද රූපවලින් පෙනෙන්නේ මේ අලුත් සංකෙතය එකමතිකව නොපිළිගත් බවයි. 'ඇ' අලුත් සංකෙතය පුරුදු වන්නට පෙර ක්‍රි. 2 ශ. වෂීයේ පටන් 'ඇ' වෙනුවට ලියන ලද්දේ 'එ' යන්න යි. ක්‍රි. 2 ශ.ව. පටන් සෙල් ලිපිවල 'ඇ' වෙනුවට 'එ' යෙදුණ ආකාරය වෙව, පෙණි, වෙඩ, අමෙති, රෙජෙන ආදි වචනවලින් පෙනේ. මෙවා (ක්‍රි. 7 ශ.ව.) 'ඇ' විශෙෂ සංකෙතය හැඳින ගැනීමෙන් පසුව වැව, පැණි, වැඩ ඇමැති, රැජැන, විසින් යෙදෙන්නට විය. අලුත් සංකෙතය මෙන් ම එහි පැරණි සංකෙතය වූ 'එ' යනුත් එක ම වැකියක යෙදුණු හැටි "බෙලුම් නැක්තන්" යන්නෙන් පෙනේ. එකම වචන පරිසරයෙහි එක ම තැන 'ඇ' 'එ' යෙදුණ සැටි නෙගි, නැගි ආදියෙන් පෙනේ.

මධ්‍යතන ඉන්දු ආර්ය භාෂාවල 'අ' ගුරුත්වයෙන් යෙදුණ වචනවල ඉන් පරව ඉ | ඊ | ය් වැනි අක්ෂරයක් වී නම් ඉන් පෙරටුව ඇතැයි කී ගුරු 'අ' කාරය (ක්‍රි. 2 ශ.ව.) 'එ' බවටත් එය සමහර පරිසරයක දී පමණක් ක්‍රි. 7 ශ.ව. පමණ 'ඇ' බවටත් පත් වේ. එය අභිශ්‍රැතියේ[27] එක් අවස්ථාවකි. (වාපි>වපි/වවි>වෙව>වැව, පත්‍ති>පති>පෙත.) +ඉය> ඇ බවට මෙකල සම්මිශ්‍ර වී ඇත. (සාකිය>සැහැ; මුලිය>මීලැ.) සමහර 'එ' සහිත ප්‍රකෘති ද ඇ බවට පත් විය. (මෙව>මේ>මෙ>මැ) තාලව්‍යාක්ෂර සහිත ප්‍රකෘතිවලින් 'ඇ' ශෙෂ වෙයි. (ශර>සැර, ජණ>සැණ) ආදි වශයෙනි.

---

25 *Sigiri Graffiti*, Vol. I, pp. XXIX (f).

26 තෙන්නකෝන් විමලානන්ද–පැරණි ලංකාව හා ශිලා ලිපි, ii–iv අවධිය 10 වි. 1 (ඇ) (ක්‍රි.ව. 703).



27 GSL., p. 18–12

එහෙත් ක්‍රි. 7 ශ.ව. තෙක් භාෂාවේ නොපැවති අක්ෂර සංකෙතයක් එකල ලිඛිත අක්ෂර මාලාවට ඇතුළත් විය නොහැකි ය. ව්‍යාකරණ විෂයෙහි වූ මෙබඳු සිද්ධාන්ත ව්‍යාකරණඥයන් පොළොන්නරු දඹදෙණි යුග තෙක් ගරු කළ නිසා ම ඇ, ඈ, සංකෙත දෙක (භාෂාවේ භාවිත වුව ද) සිද්ධාන්තයක් වශයෙන් හෝඩියට ඇතුළු නොකරන ලදී. 'ඇ' සිදත් හෝඩියට ඇතුළු නොවීමටත් නිදහස් ස්වරයක් ලෙස අගය නොකිරීමටත් වෙනත් හේතු රාශියක් තිබේ.

ඇ ඈ, ඉන්දු ආර්ය භාෂාමය අක්ෂරයක් නො වී ය. එය සිංහලයෙහි හට ගත්තේ ක්‍රි. 7 ශ. වර්ෂය තරම් පසු කාලයක හෙයිනි. එය ඓතිහාසික ස්වර අතරට අමුත්තෙකි. අනෙක කලින් පැවති ස්වරයක වෙනස් වීමෙන් එතැන 'ඇ' හට ගත් නිසා එය විකෘත ස්වරයකි. එ සහ ඇ යන ශබ්ද දෙක ම 'එ' ස්වරයෙන් දීමට පුරුදුව සිටි සමාජයක් 'ඇ' වැනි අලුත් ලකුණක් එතරම් අගය නොකරන්නට ඇත. (අදත් එෆ් ශබ්දය දීමට ෆ, fප, ඵ්‍ෆ වැනි සංකෙත යොදන නමුත් ඒවා වර්තමාන හෝඩියට අක්ෂර වශයෙන් ඇතුළත් නොකරන්නේ පුරාණ සම්ප්‍රදය බලවත් හෙයිනි.) සිදත එසේ කිරීමෙන් හෝඩිය පිළිබඳ ඓතිහාසික සම්ප්‍රදය ආරක්ෂා කර තිබේ.

ගුණ වෘද්ධි යන නම්වලින් හැඳින්වෙන ව්‍යාකරණ විධියක් සම්ප්‍රදායානුගත (සංස්කෘත) ව්‍යාකරණ ග්‍රන්ථවල ද ඇත. ගුණස්වර (අ, එ, ඔ, අර්, අල්) සහ වෘද්ධි ස්වර (ආ, ඓ, ඖ, ආර්, ආල්) යනුවෙන් සංස්කෘත හා වෛදික භාෂාවල[28] ඉගැන්වෙන ස්වර සංහිතා විධිය එක් අතකින් සිදතේ ඉගැන්වෙන 'මත් වැඩිය' හා සැසඳීම වටී.

"වැඩි නම් මත් වැඩි–ඇස්, ඇල්, ඇප්, උවාරණ, නවාම් මලවල සල සිහිලේහි"[29]

මෙහි වැඩිය (වෘද්ධිය) මාත්‍රා වෘද්ධියක් බව ද කලින් පැවති මාත්‍රා ප්‍රමාණයට වඩා මාත්‍රාවකින් හෝ මත් අඩකින් හෝ වැඩි වීම නිදසුන්වලින් දැක්වෙන බව ද සන්නය ඉදිරිපත් කරයි. ඒ අනුව මත් වැඩිය ත්‍රිවිධ යි. i. අ > ඇ වීම, ii. අ > ආ සහ එ > ඒ වීම, හෙවත් හ්‍රස්ව දීර්ඝ වීම, [iii. හල් අකුරුවල ස්වර භක්තිය] යනු යි.

මින් ii ක්‍රමය වන 'සිහිලෙහි' යනු 'සිහිලේහි' වීම ඡන්දශ්ශාස්ත්‍රය අනුව ද මත් වැඩියකි. මත් හතර පහක් වූ හෙයිනි. 'උවාරණ', 'නවාම්' යන්නෙන් අදහස් කරන ලද්දේ ද එය යි. (උපකරණ, නවකම්ම යන පද සිංහල වන්නේ උවාරණ නවාම් යනුවෙනි. උපකරණ > * උවඅරණ > උවාරණ; නවකම්ම > * නව අම් > නවාම් භාෂා ප්‍රවෘත්තිය අනුව යි. පසුව මත් අඩු වීමෙනි, උවරණ නවම් වන්නේ. මෙහි ඇත්තේ සන්නය කී මත් වැඩියක් නොව මත් අඩුවකි.) [iii ක්‍රමය 'මල වල් සල්' යනු 'මල වල සල' වීම ය.– වල් (∪), සල් (∪), යනු වල (––), සල (––) වීමේ දී මාත්‍රාවල වෙනසක් වුවත් මත් වැඩුමක් නො වී ය. වල් – වල, සල් – සල යන කුමක වුවත් ඇත්තේ මාත්‍රා දෙකක් පමණි.] iii වන ක්‍රමය සිදත් සඟරා කතුවරයා ගේ අදහසක් නොව සන්න කරුවන් ගේ භ්‍රමයක් බව ඩබ්ලියු. එෆ්. ගුණවර්ධන මුදලිඳු ගේ මතය[30] යි

---

28 ඉකො ගුණ වෘද්ධී (පාණිනී 1-3.)
A. A. Macdonell – *A Vedic Grammar*, p. 21. 17.

29 සිදත් සඟරාව, 1–37.

30 ඩබ්ලියු. එෆ්. ගුණවර්ධන – සිද්ධාන්ත පරීක්ෂණය, (සි.ප.) 146 පිට

i ක්‍රමය අස් (∪), අල් (∪), අප් (∪) යනු පසුව පිළිවෙළින් ඇස් (∪), ඇල් (∪) ඇප් (∪) වීම යි. එහි ද ස්වරයේ වෙනසක් විනා මාත්‍රා සංඛ්‍යාවේ කිසිදු වෙනසක් නො වී ය. මෙ පරිදි අ>ඇ වීම අඩමතක වැඩීමකැ යි යන සන්න කරුවන් ගේ අදහස ඔප්පු නො වේ, (මෙහි ද භාෂා ප්‍රවෘත්තිය අනුව අක්ෂි>ඇස්, ශිතල>*හිඅල> *හෙල්>හැල්>ඇල්, යනු ය. එ හෙයින් භාෂා ප්‍රවෘත්තිය අනුව අස්> ඇස් හෝ අල්> ඇල් වීම සැක සහිත ය.)

i [සහ iii] ක්‍රමයෙහි දී ඡන්දසක වෘත්තගත මාත්‍රාවක වැඩි වීමක් නො වී ය. සිදතේ මත් වැඩි යන්න ඡන්දස් හා වෘත්ත පිළිබඳ සිද්ධියක් නම් ඡන්දශ්ශාස්ත්‍රයෙහි නියමිත ගුරු ලඝු මාත්‍රා නියමයට ඒවා සීමා විය යුතු ය. ii සිහිලෙහි යනු සිහිලේහි වූ සෙයිනි. එහෙත් [සල්>සල හෝ] අස්>ඇස් වීමේ දී එවැන්නක් නො වී ය. [මේ ස්වර භක්ති හා] ඇ නිසා වෘත්තයක මාත්‍රා සංඛ්‍යාව වැඩි නො වේ.

මෙහි මත් යනු ඡන්දෝවෘත්තගත ලඝු ගුරු මාත්‍රා නොවන නිසා මත් යන්නේ අර්ථය අනෙකක් විය යුතු ය. මත් යන්නේ මාත්‍රය, ප්‍රමාණය යන අර්ථය ද ඇත. එවිට මත් (ප්‍රමාණය) යනු උච්චාරණය – අකුරේ ශබ්දය සමඟ නොව එහි පද රූපය – සංකේතය හා සම්බන්ධ ලක්ෂණයකි. මුල සිට භාෂාවේ නොතිබුණ විශෙෂ පිළි සංකෙත පසුව එක් වීම නිසා ලිඛිත අක්ෂරයේ ප්‍රමාණය වැඩෙයි. මෙහි දෙන ලද නිදසුන් තුන් වර්ගය වූ (1) ඇ පිල්ල (2) හල් (කොඩි) ලකුණු සහ (3) දීර්ඝ ස්වර දක්වෙන පිළි ක්‍රි. 7 ශ. වර්ෂයට පෙර භාෂාවෙහි නොවූ දෑ ය. ඒවා භාෂාවේ අක්ෂරවලට එකතු වූයේ පසුව හෙයින් මත් (ප්‍රමාණයේ) වැඩීමක් ලෙස සලකා ඇත. (මෙසේ ම පෙර භාෂාවෙහි වූ ස්වර සංකෙත [ : පිළි ] වෙනස් වූයේ නම් ඒවා ‘ පිළි පෙරළි ’ නම් වේ.)

‘ ඇ ’ අ කාරයේ ම මත් වැඩුමක් ලෙස සැලකීමට විශෙෂ හේතුවක් තිබේ. එනම් ඇ රූපය නිපැදුණේ අ යන්නේ රූපයෙන් වීම යි. ක්‍රි. 7 ශ. වර්ෂයට පෙර ශබ්දෝච්චාරණ– යේ දී මෙන් ම ලෙඛනයෙහි දී නම් ඇ යන්න ළං වූයේ (අ යන්නට නොව) ‘ එ ’ යන්නට බව කලින් ද ප්‍රකාශ විය. පෙතැලි – පැතැලි, පෙරැම් – පැරැම්, පෙණ – පැණ (පැණ අතරායා–මයූර සන්දෙශ), මෙණ – මැණ, මෙ – මැ සහ මෙ අත – මැත, දෙ අත – දැත යන විපර්යාසයන් ගෙන් ද එය පැහැදිලි වේ. මේ අනුව උච්චාරණය ඇසුරින් නම් ‘ ඇ ’ යන්නේ මත් වැඩුම ආ යුතු වන්නේ අ යන්නෙන් නොව එ යන්නෙනි. ඇ යන්න මත් වැඩුමකැ යි සිදත් සඟරාව කියන්නේ උච්චාරණය නොව ලිඛිත සංකෙතය දෙස බලා ගෙන ය. ඇ යන්නේ ඇ (ැ) පිල්ල හෙවත් ඇදය සඳහා මාත්‍රාංශය යි කියන්නේ ද අ යන්නට එකතු වන එම ලකුණු කැබැල්ලට ය. අ සහ ඇ සමාන වන්නේ ලිඛිත රූප වශයෙනි. ශබ්ද වශයෙන් නම් අ, ඉ, ඇ, එ, ඔ මුළුමනින් ම එකිනෙක වෙනස් ස්වර ය. ඒ අනුව ‘ මත් ’ යනු පද්‍යකරණයට උවමනා ‘ මාත්‍රා ’ නොවන බව මෙයින් ස්ඵුට වේ.

(iii) සිදත් සඟරාවට මහාප්‍රාණ අක්ෂර ඇතුළු නොවීමේ හේතුව එය පද්‍ය කරණය සඳහා සම්පාදිත කෘතියක් වීම බව සුගතපාල ද සිල්වා මතය විය. ඩබ්ලියු. එෆ්. ගුණවර්ධන මුදලිඳු කියන්නේ එය ද්‍රවිඩ බල පෑම නිසා වූ බව ය[31]. ඇ ඈ ඇතුළත් නොවූයේ පද්‍ය කරණය හේතුවනැ යි සුගතපාල ද සිල්වා මහතාට මේ අනුව නො කියහැකි හෙයින් එය අසම්පූර්ණ මතයක් වෙයි. ඇ ඈ ද්‍රවිඩ ලිපි මාලවේ ද නැති හෙයින් මෙහි දී ගුණවර්ධන මතය වඩා බලවත් වෙයි. ද්‍රවිඩ බල පෑමේ හේතුව මෙහි ලා නොයෙදෙන්නේ එහි වූ ල කාර තුන හා න කාර තුන ද වෙනත් විශෙෂ (ඊර) අකුරු ද සිදතට නොපිවිසි හෙයින් ද වේ.

---

31 සි. ස. 100 පිට.

මහාප්‍රාණාක්ෂර ලංකාවේ ආදිම බ්‍රාහ්මී ලිපිවල හෝ පුරාණ සිංහල අවධියේ හෝ නො ලැබේ. (කලාතුරෙකින් කොරවක්ගල, කොතල කිඹියාව වැනි බ්‍රාහ්මී ලිපියක (''කහොජ'' ''පුථන'', ''සමික'' විසින්) මහාප්‍රාණාක්ෂර යෙදුණේ මාගධී අනුකරණයෙනි. ධම්ම රක්ඛිත, වෙනුවට දම රකිත, සංඝ වෙනුවට සග යනුවෙන් අල්ප ප්‍රාණාක්ෂර ලිවීම භාෂාවේ පොදු ලේඛන සම්ප්‍රදය විය. එහෙත් සිධ, සධය, කධිත වැනි මහාප්‍රාණ අකුරක් දෙකක් දක්නට ඇත. සමහර විට Σ, ⅃ යන අකුරු ජ, කධ ය යි මුල දී ශබ්ද කළත් පසුව 'ජ' සඳහා ම යෙදූ රූප දෙ වර්ගයක් සේ පෙනේ. සිධ යන්නේ 'ධ' විශේෂ වචනයකට අයත් ය. එය 'සිද්ධං' යන වචනයේ තත්සම රූපයක් විය හැකි ය. (සිධ ය යි ලියුවේ 'සිද්ධම්' වෙනුවට ය. මෙකල සංයුක්ත හා හල් අකුරු නො ලියවේ.)

ලංකාවේ පමණක් නොව ඉන්දියාවේ ද මහාප්‍රාණාක්ෂර අභාවයට යමින් පැවති ආකාරය ප්‍රාකෘත සාහිත්‍යයෙන් ද පෙනේ. ඛ, ඝ, ථ, ධ, භ, යන අකුරු වෙනුවට වචනවල 'හ' ශේෂ වී ඇති සැටි ප්‍රාකෘත ව්‍යාකරණයට[32] පවා පිළිගැනුණු ධර්මතාවකි. මුඛ වෙනුවට 'මුහ' මධුමථන වෙනුවට 'මහු මහණ' ගභීර වෙනුවට 'ගහිර' ආදිය නිදසුනි. සිංහලයෙහි ද සමහර තත්සම වචන හැර ආදිම සිංහල වචන ලියවුණේ අල්ප ප්‍රාණ සංකෙත මගිනි. මේ අනුව සිදතට මුල් වූ ක්‍රි. 7 ශ. වර්ෂයට පෙර හෝඩිය මහාප්‍රාණ වියුක්ත විය. සිදත ද ඒ අනුව ගියේ ය.

'ච' අල්ප ප්‍රාණාක්ෂරයක් වුව ද සිදත් හෝඩියට ඇතුළු නො වී ය. එය මුල දී පද්‍ය භාෂාවේ හෝ ද්‍රවිඩයේ නොපැවති නිසා ම නොව, සිදතට මුල් වූ ක්‍රි. 7 ශ. වර්ෂයේ දී ද භාෂාවේ දුර්ලභ අකුරක් වූ හෙයිනි. සිංහල ප්‍රාකෘත යුගයේ චෙත, චතර (චර) වැනි වචනවල 'ච' භාවිත වූ නමුත් සිංහල භාෂා පරිණාමය අනුව එය ක්‍රමයෙන් අභාවයට පත් විය. චෙත, චතර ආදිය සෙය, සතර යනුවෙන් ච>ස බවට වෙනස් විය. සමහර විටක ච>ජ>ද බවට වෙනස් විය. 'ශ' වුවද ප්‍රාකෘත යුගයේ මුල් කාල පරිච්ඡේදයේ ලෙන් ලිපි බසෙහි සුලභ වුව ද එය නොබෝ කලකින් ම 'ස' බවට වෙනස් වී ය. ෂ, (අ)ඃ යනු ද පාලියේ මෙන් ම පූර්වෝක්ත යුගවල සිංහල ලිපිවල ද නො වී ය.

(iv) බිඳුව ද ක්‍රි. 7 වන ශත වර්ෂය තෙක් සෙල්ලිපිවල නැත. ගංගා වෙනුවට ගග, සංඝ වෙනුවට සග වැනි රූප ලියවුණේ ඒ බැවිනි. අශෝක ලිපිවල භාෂාවේ ද බිඳුව නො ලියා හැරීම පෙනේ. ථූප, දන, දෙය ධම පාශඩාන, මනුෂාන, බම්භනාන, මහාමාත්‍රන වැනි යෙදුම් හා සාහිත්‍ය ප්‍රාකෘතයේ ගණාන, මඅආණ, ආදිය ද සැලකිය යුතු ය. මේ අනුව ක්‍රි. 7 ශ. වර්ෂය තෙක් මුලින් දැක්වූ ගුරු ස්වර සමඟ මහාප්‍රාණාක්ෂරත් මෙම බින්දුවත් සිංහල භාෂාව ලියූ සාමාන්‍ය ලේඛන ක්‍රමයට ඇතුළත් නො වී ය. සිදත ලියූ දඹදෙණි යුගය තෙක් අධ්‍යාපනයෙහි පැවති ව්‍යාකරණ සම්ප්‍රදය එය විය. (ව්‍යවහාර භාෂාවේ පවත්නා බොහෝ භාෂා රීති උගතුන් ගේ ලේඛන භාෂාවට ඇතුළු වන්නේ බොහෝ කල් ගත වීමෙනි. එය ද ව්‍යාකරණ සිද්ධාන්තයක් වන්නේ උගතුන් ගේ තර්ක විතර්කවලට අසු ව කල් යාමෙන් නව වියරණ ග්‍රන්ථයක් ලියවෙන විටක ඒවා අගය කළ හොත් පමණි.) පඬිවරයන් අතර සිද්ධාන්ත බවට පත් වූ එම පුරාතන ව්‍යාකරණ සම්ප්‍රදයෙහි එකී සංකෙත ඇතුළත් නොවූ බැවින් අභිනව ව්‍යාකරණයේ ලිපි මාලාවට ඒවා ඇතුළු කිරීම සිදත් කතුවරයාට මුණ පෑමට සිදු වූ බලවත් ප්‍රශ්නයක් විය. පුරාතන ව්‍යාකරණ සම්ප්‍රදය කොතරම් ප්‍රබල වී ද යත් භාෂාවේ තහවුරුව පවත්නා සමහර අකුරු

32 වරරුචි – ප්‍රාකෘත ප්‍රකාශ ('ඛඝථධභාං හඃ') 2–25.

පවා අලුතෙන් හෝඩියට ඇතුළු කිරීම ඔහුට දුෂ්කර විය. ගුරු පසට මෙන් බින්දුවට ද හේතූදාහරණ පැමටත් බින්දුව කව් ලැකියෙහි හා ලෙව් ලැකියෙහි පවත්නා බවට කරුණු කීමටත් එතුමාට සිදු විය.

(v) බිඳුව අභිනවයෙන් ලිපිගත කිරීමේ හේතු සාධක වශයෙන් ඉදිරිපත් කළ නිදර්ශන දෙවගයෙන් එකකි, 'රඟ බඟහර ඈහි උනුමතින් උසුරුවන හෙයින්'[33] යන්න. මධ්‍ය ඉන්දු ආර්ය භාෂා යුගවල රඞ්ග, බඞ්ගහාර? ආදියෙහි නාශික්‍යාක්ෂර ශබ්ද වූයේ පූර්ණ වශයෙනි. ඒවා සිංහලයෙහි රඟ, බඟහර ය යි ලියවෙන්නේ පූර්ණ අනුනාශික්‍යය තවත් ඌන වීමෙනි. එහි ඌන මාත්‍රය හෙවත් මාත්‍රාංශය වන්නේ ග කාරයේ වම් කොනට එකතු වන 'ඞ' කාරයේ මුල් කොටස (ˆ) වන අර්ධනාශික්‍ය-යකි. එසේ සංයුක්ත වීම–එකතු වීම නිසා එය 'සඤ්ඤක' යනුවෙන් ද හැඳින්වේ. මෙහි අක්ෂර රූප වශයෙන් ද අක්ෂරයේ මාත්‍රය–ප්‍රමාණය අඩු විය. ඞ කාරයේ අර්ධය වූ සඤ්ඤක ලකුණ උනුමත් වූයේ එසේ ය. එය ද මාත්‍රාංශයකි. ඟ, ඬ, ඳ, ඹ යනුවෙන් මේවා සිදත් සඟරාවට සංග්‍රහ විය.

ක්‍රි. 8–10 ශත වර්ෂ වන විට බිඳුව හා එහි (උනුමත්) අර්ධානුනාශිකාක්ෂර (සඤ්ඤක අකුරු) සිංහලයෙහි ඈතත් දුර්ලභ විය. 'සිරි සඟ්බොය්' 'සඟ් සෙන් අරම්'[34] ආදි වශයෙනි. අඟනන්, අග්නන්, අඟනන් වැනි වෛකල්පික රූපවලින් පෙනෙන්නේ සීගිරි ගී ලියවුණු (8–10 ශ.ව.) සමයෙහි පවා එය එකමතිකව පිළිගැනුණු ලෙඛන විධියක් නොවූ බව ය. එහෙයින් එය සිදත් සඟරාවේ හෝඩියට ඇතුළත් නොවීම සම්ප්‍රදායානුකූල ය. තවත් කරුණක් නම් ක්‍රි. 7 ශ. වර්ෂයට පෙර ලෙඛන සම්ප්‍රදයේ නොවූ අලුත් සංකෙතයක් වීම මෙන්ම එය ද 'ඇ' කාරය සේ වෙනත් අකුරක විකෘතියක් වීම යි. එහෙයිනි. ඒවා වෙනත් ව්‍යාකරණ විධානයන් යටතේ දක්වන ලද්දේ.

මෙහි විශෙෂයක් නම් මේ සඤ්ඤක රූප උනුමත් වූයේ අක්ෂර සංකෙතයෙන් පමණක් නොව උසුරුවීමෙන් ද යන දෙ ආකාරයෙන් ම වීම යි. රඟ, ගඟ, සැඬ යන රූප නිපන්නේ රඞ්ග, ගඞ්ගා, චණ්ඩ යන බිඳුවේ කණ්ඨජ මූර්ධජ අනුනාශික්‍ය රූප ඌනමාත්‍ර (අර්ධ) බවට පත් වීමෙන් නමුත් මෙහි උච්චාරණවලින් ද එම මත් අඩු ව ප්‍රකට වේ. කඳ, බඹු යන රූප මුල දී කන්‍ද, බම්බු යනුවෙන් ද ලියූ බව 8–10 ශ. වර්ෂවලට අයත් සමහර සෙල් ලිපි හා සීගිරි ගී පාඨවලින් ද පෙනේ. සන්ද්–සඳ්, අඳවයි–අන්ද්වයි, කුඹුර්–කුම්බුර් යනු ද නිදසුනි. මේවා පූර්ණ වර්ගාන්තවලින් ලියුව ද එසේ උච්චාරණය නොකළ බවත් අඩුමත් ව හෝ උනුමත් ව කියවූ බවත් වෘත්තගත වූ ලඝුගුරු මාත්‍රා ගණන් කිරීමේ දී පැහැදිලි වෙයි. මේ උනුමත් සඤ්ඤක නිසා ගී විරිත්වල මාත්‍රා නම් අඩු වැඩි නොවන හෙයින් මෙහි ද මත් යනු පද්‍යකරණයට අවශ්‍ය හෙවත් ඡන්දෝ-වෘත්තගත ලඝුගුරු මාත්‍රා නොවන බව සැලකිය යුතු ය. ගන්‍දෙල් (–∪), කුම්බුර් (–∪) මුල දී පුනුමත් රුවින් ලියුව ද ඒවා උච්චාරණය වූයේ ගඳෙල්, කුඹුර් යනුවෙන්ම ය. එසේ ම 'ම්බු', 'න්‍ද' යන පුනුමත් රූප උනුමත් රූප බවට පත් වන්නේ 'ඹු', 'ඳ' ඈ විසින් ලියවෙන විට ය.

(vi) සිදත් සඟරාව සංස්කෘත ආදියෙහි පුං–ස්ත්‍රී–නපුංසක ලිංගත්‍රය වෙනුවට පුම ඉතිරි ලිඟු දෙක පමණක් සිය බසෙහි වෙති යි දක්වයි. සිදත අනුව බඹ, සුර, අසුර වැනි සචෙතන නාම මෙන් ම පත්, රිය, දිය, දල, රුවන්, පිරිකර වැනි අචෙතන නාම ද

---

33 සි. ස. 1–7.

34 E. Z, Vol. I, No. 7, p. 85.
E.Z., Vol. 1, No. 4, p. 43.

පුල්ලිංග ය. රුවන් (<රතනං), පිරිකර (<පරික්ඛාරං) යන වචන මධ්‍යතන ඉන්දු ආර්ය භාෂාවල පවා පුල්ලිංග නොව නපුංසක ලිංග ය. මාතෘ භාෂාවල පුල්ලිංග හා නපුංසක ලිංග නාම ගණ දෙක ම සිදත් සඟරාවේ පුං ලිංග වෙයි.

මෙය ද සිදත ලියූ (දඹදෙණි) කාලයේ භාෂා රීතිය නොව සිංහල ප්‍රාකෘත යුගයේ පැවති භාෂා ලක්ෂණයකි.

| | ම. ඉ. ආ. | | සිං.ප්‍රා. (ක්‍රි.පූ. 3–ක්‍රි. 2 ශ) | | ක්‍රි. 8 ශ. |
|---|---|---|---|---|---|
| පුං | රාජා<br>පුත්තෙ<br>නාගෙ | පුං | රජෙ<br>පුතෙ<br>නකෙ | පුං | රජ්,<br>පුත්<br>නය්/නා |
| නපුං | දනං<br>ලෙණං<br>සෙනාසනං | පුං | දනෙ<br>ලෙණෙ<br>සෙනසනෙ | නපුං | දන්<br>ලෙණ්<br>සෙනසුන් |

ක්‍රි. පූ. 3 ශ.—ක්‍රි. 2 ශ. වර්ෂය තුළ සිංහල ප්‍රාකෘත යුගයේ දී පුල්ලිංග හා නපුංසක ලිංග දෙක එකක් බවට පත් වී ඇති බව රජෙ, දනෙ වැනි ප්‍රයෝගවලින් පෙනේ. '–එ' පුල්ලිංග ප්‍රථමා විභක්ති එක වචනය නෑ. අශෝක, මාගධී, අර්ධමාගධී භාෂාවල ආභාසයෙන් සිංහලයෙහි ද නොවෙනස් ව යෙදිණ. සිංහලයෙහි දී එම පුල්ලිංග '–එ' රූපය මුල් නපුංසක නාම ප්‍රකෘතිවලට ද ව්‍යාප්ත වීමෙනි, මෙකල දනෙ, ටබෙ, පටකෙ[35] වැනි පුල්ලිංග රූප පහළ වූයේ. මින් ප්‍රකාශ වන්නේ මෙ කල සිංහලයෙහි දී මාතෘ භාෂාගත නපුංසක ලිංගය පුල්ලිංගයට ම අන්තර්ගත වූ බව යි. බෙංගාලි වැනි භාෂාවල ද[36] අචෙතන ආගී (ගින්න) පූථී (පොත), ස්ත්‍රී ලිංග වූයේත් මේ ආකාර ලිංග විපර්යාස හේතු කොට ගෙන ය. හින්දි, සින්ධි. පංජාබි, කාශ්මීරි ආදියේ සහ ප්‍රංශ, ඉතාලි, ස්පාඤ්ඤ වැනි යුරෝපීය රොමකීය භාෂාවලත් පුං ස්ත්‍රී ලිංග දෙක පමණි ශෙෂ ව ඇත්තේ.

සිං. ප්‍රා. යුගයේ මුල් අවස්ථාවේ දී ම. ඉ. ආ. භාෂාවලට සමාන වූ ඓතිහාසික නපුංසක ලිංග බහු වචන රූපයක් විරල ව ඇත. ලෙණනි (< ලෙණානි) පවණි (<* පව්වයාණි) යනුවෙනි. එහෙත් පසුව නපුංසක ලිංගය පුල්ලිංගයට ම අන්තර්ගත වීමේ මුල් ලකුණු වශයෙන් එම විශෙෂ රූප ක්‍රමය අභාවයට ගියේ ය. ඒ වෙනුවට 'රජ' (=රජවරු), 'පුත' (=පුත්තු) යන සචෙතන පුල්ලිංග බහු වචන රූපවලට ම සමාන ව 'ලෙණ' (=ලෙන්) 'විසති කහවණ' (=විසිකහවණු) යන පොදු පුල්ලිංග බහු වචන ක්‍රමය බලවත් වී තිබේ.

සිදත් සඟරාවේ නිදසුන් අතර දෙව් දූ, නැයිනි, අඹු, සුහුල් වැනි සචෙතන නාම මෙන් ම විදු, ලිය, වසා, පෙළ, බිම්, මෙවුල් ආදි අචෙතන නාම ද ස්ත්‍රී ලිංගයෙහි දැක්විණ. වර්තමානයෙහි අචෙතන නාම නපුංසක ලිංග ය. ක්‍රි. 2 ශ. වර්ෂයෙන් පසු නාම පදයේ ප්‍රාණි අප්‍රාණි භෙදය උග්‍ර වීම නිසා අචෙතනික නාම (–දිය, විදු, දල, බිම්) නපුංසක ලිංග වූ බව පිළිගෙන ඇත.

---

35 HSN. pp. 96–97. 48.

36 S. K. Chatterji – *The Origin and Development of Bengali Language* – ii, p. 672.

මාතෘ භාෂාවල ස්ත්‍රී ලිංගය භජනය කළ (විද්‍යුත්) විජ්ජු, භූමි, ලතා ආදි ශබ්ද විදු, බිම, ලිය ය යි තද්භව වූ විට සිංහලයෙහි වර නැඟෙන්නේ ස්ත්‍රී ලිංග නාම ලෙස නො ව නපුංසක ලිංග නාමවල ආකාරයෙනි. එහෙත් සිදත් සඟරාව මේ නපුංසක වචනවලට මාතෘ භාෂාවල වූ (ස්ත්‍රී) ලිංගය පැවරුවේ ද සිංහල ප්‍රාකෘත යුගයෙහි සිංහල භාෂාව අනුව පිළිගත් ඉතා පුරාතන ව්‍යාකරණ සාම්ප්‍රදායික සිද්ධාන්ත අනුව ය.

| ම. ඉ. ආ. | | සිං. ප්‍රා. | | පුරාණ සිං. | | නූතන සිං. | |
|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | වාපි<br>පත්ති | ස්ත්‍රී | වපි / වවි<br>පති | නපුං. | වෙව<br>පෙත | නපුං. | වැව<br>පෙත් |

ක්‍රි. පූ. 3 ශ—ක්‍රි. 2 ශ. තෙක් සිං. ප්‍රා. යුගයේ දී පැවතුණේ ම. ඉ. ආ. ( =පාලි ප්‍රාකෘතවල ) ව්‍යාකරණ ලිංග ( Grammatical Gender ) ක්‍රමය වේ. වැව යන තේරුමේ වපි / වවි යන වචන ද වාපි යන්න මෙන් ම එකල ස්ත්‍රී ලිංග විය. චිත්තා, උප්පලා, කමලා, යන ස්ත්‍රී ලිංග සංඥා නාමවල සම්බන්ධ විභක්ති එක වචනය චිතය, උපලය, කමලය, යනුවෙන් ලියවුණේ ස්ත්‍රී ලිංග නිසා ය. වාපි, පත්ති යන ම. ඉ. ආ. ස්ත්‍රී ලිංග නාම ද සිං. ප්‍රාකෘතයෙහි සම්බන්ධ එක වචනයේ දී වවිය, පතිය යයි යෙදුණේ ද ඒවාත් ස්ත්‍රී ලිංග හෙයිනි. සිදතේ විදු, බිම් ආදිය ස්ත්‍රී ලිංග වූයේ ද එසේ ය.

මෙ සේ සලකන විට සිං. ප්‍රා. යුගයේ සිංහලයෙහි පැවති ලිංග (පුං-ස්ත්‍රී) ක්‍රමය සම්ප්‍රදායක් වශයෙන් සිදත් සඟරාවට මුල් වන්නට ඇති බව ඉතා පැහැදිලි ය.

මේ කරුණු අනුව අප පැහැදිලි කරන ලද්දේ සිදත් සඟරාව හුදෙක් පද්‍ය කරණය පමණක් සීමා කොට ලියූවක් නොව ගද්‍ය පද්‍ය දෙකට ම අදළ පුරාතන ව්‍යාකරණ සිද්ධාන්ත කොටසක් සංග්‍රහ කළ ග්‍රන්ථයක් බව යි. තත්කාලීන අධ්‍යාපනයෙහි පැවති පෙළ, සකු, දෙමළ වැනි භාෂාවලට ලියන ලද සම්ප්‍රදායානුකූල ව්‍යාකරණ ග්‍රන්ථවල ද අභාසය ලබා ඇති එය කාලාන්තරයක් තිස්සේ ආචාර්යවාද වශයෙන් රැක ගෙන ආ ඓතිහාසික සිද්ධාන්තවලින් ද පොෂණය වී ඇති බව යි.